**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - 2018**

**------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------------**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමටප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

-------------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 42 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති පිරිවැය රු.421,066,408 ක්වූ වත්කම් විෂයයන් 09 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වී ඇතත් එම වත්කම් තව දුරටත් භාවිතා කරන බැවින් නැවත අගය කර ගිණුම් වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි | විගණකගේ කරුණු දැක්වීම සමග එකඟ වේ.දැනට ස්ථාවර වත්කම් නැවත අගය කිරීමක් සිදු කරන අතර වත්කම් නැවත අගය කිරීමෙන් අනතුරුව 2019 වරෂයේ දී ගැලපීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි උපචිත වියදම් ලෙස රු.50,614,478 ක් (පීඨ උපචිත වියදම් හැර) දක්වා තිබුණද, ගණනය කිරීම් අනුව එය රු.67,489,879 ක් වූ බැවින් සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් හා වර්ෂයේ ඌනතාවය රු.16,875,401 කින් අඩුවෙන් දක්වා තිබුණි. | විගණකගේ කරුණු දැක්වීම සමග එකඟ වේ.මෙම වවුචර් ගෙවිය යුතු වියදම් ගිණුම්වලට උපචිත කිරීමේදී මග හැරී ඇත. | නිවැරදි වටිනාකම් ගිණුම්වලට පිටපත් කල යුතුය |
| ආ) සමාලෝචිත වර්ෂයේදී වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨයේ සහ කෘෂිකර්ම පීඨයේ නිලධාරීන්ගෙන් අයකර තිබූ එකතුව රු.123,248 ක් වූ උපයන විට ගෙවීම් බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර විශ්වවිද්‍යාලීය විවිධ ආදායම් ගිණුමට බැර කර තිබුණි. | විගණකගේ කරුණු දැක්වීම සමග එකඟ නොවේ. මෙම මුදල් වටිනාකම උපයනවිට ගෙවීම් බදු මුදලක් නොව විශ්වවිද්‍යාලයෙන් බාහිර සම්පත් දායකයින්ට කල ගෙවීම් වලින් අඩු කරන ලද රාජ්‍යභාග අඩු කිරීමයි. එම මුදල් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීමේ අවශ්‍යතාවයක් නැත. එම මුදල් එම සම්පත් දායකයින් සේවයේ නියුතු ආයතන වෙත ප්‍රේෂණය කිරීම සඳහා වෙන්කර ඇත. | අඩු කරගත් ආදායම නිවැරදි ගිණුම් වලට පිටපත් කර නොපමාව අදාල ආයතන හෝ පුද්ගලයන් වෙත ලැබීමට කටයුතු කල යුතුය |
| ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.586,600ක් වටිනා තොරතුරු තාක්ෂණ උපකරණ මිලදීගෙන තිබූ නමුත් රඳවාගත් රු.58,660 ක මුදල ප්‍රාග්ධනිත නොකර ශුද්ධ මුදල වූ රු.527,940 පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. | විගණකගේ කරුණු දැක්වීම සමග එකඟ වේ. මෙය අත්හැරීමකින් මුදල් අගය පමණක් වත්කම් ගිණුමට හර කර ඇත. රඳවා ගත් මුදල් රු. 58,660 ක මුදලක් වත්කම් ගිණුම සඳහා හර කර රඳවාගත් මුදල් ගිණුම බැර කර ජනල් සටහනක් 2019 වසරේ යොදා ඇත. | නිවැරදි වටිනාකම් ගිණුම් වලට පිටපත් කල යුතුය |
| ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් තුළ දක්වා ඇති දේපල පිරියත උපකරණ මිලදීගැනීම් වල වටිනාකම රු.190,207,555 ක් වුවත් ඒ තුළ මුදල් ප්‍රවාහයක් නොවන රු.31,680,756 ක්වූ ණයට ගැනීම් සහ ගිණුම්වලට කරන ලද ගැලපිලි ඇතුළත්වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ප්‍රවාහය එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි. | විගණකගේ කරුණු දැක්වීම සමග එකග නොවේ.<br>මුදල් ප්‍රවාහ සකස් කිරීමේදී වාර්තාවේ සඳහන් මෙම රු. 31,680,756 ක් වූ ණයට ගැනීම් මිලදී ගත් වත්කම් වලින් ඉවත් කරන්නේ නම් එය ණයහිමි අගයෙන්ද ඉවත් කල යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ දී මුදලින් වූ බලපෑම් පමණක් ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් තුළ දක්වා ඇති කෙරීගෙන යන වැඩවල සමාලෝචිත වර්ෂයේ මුදල් වැයවීම රු.305,070,708ක් වුවත් ඒ තුළ මුදල් ප්‍රවාහයක් නොවන රු.25,230,620 ක ගෙවිය යුතු ශේෂ පැවතීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණකගේ කරුණු දැක්වීම සමග එකඟ නොවේ. මෙයටද ඉහත (ඇ) හි පැහැදිලි කිරීම අදාල වේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ දි මුදලින් වූ බලපෑම් පමණක් ගිණුම්ගත කළ යුතුය. |
| ඊ) සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි හා යටිතල පහසුකම් ලෙජර ගිණුම් 16 ක අදාළ ක්ෂය ගණනය කිරීම රු.2,254,486 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | විගණකගේ කරුණු දැක්වීම සමග එකඟ නොවේ. ලෙජර ශේෂ 08ක ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ සියල්ල විශ්වවිද්‍යාලයට භාර දී ඇත්තේ 2018 වර්ෂයට පෙර බැවින් 2018 මුළු වර්ෂයට සඳහාද, ලෙජර ශේෂ 03ක ව්‍යාපෘති 2018 වර්ෂයේ විශ්වවිද්‍යාලයට භාර දී ඇති බැවින් ඒවායේ අවසන් ගෙවීම් සිදු කල මාසයේ සිටද ක්ෂය වීම් ගණනය කර ඇත. | ක්ෂය වටිනාකම නිවැරදිව ගණනය කර ගිණුම්ගත කල යුතුය. |
| උ) ලංකා බැංකුවේ අනේවාසික විදේශ මුදල් (NRFC) ගිණුමෙහි 2018 දෙසැම්බර් 31 දිනට ඇ.එ. ඩොලර් 119,737ක් පැවති අතර එය රුපියල් වටිනාකමට පරිවර්තනය කිරීමේදී ගැනුම් මිල භාවිතා කළ යුතු වුවත් විකුණුම් මිලට පරිවර්තනය කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම බැංකු ගිණුමේ ශේෂය රු. 475,357 ක් වැඩියෙන් දැක්වා තිබුණි. | විගණකගේ කරුණු දැක්වීම සමග එකග වේ. ලංකා බැංකුවේ පවත්වාගෙන යන අනේවාසික විදේශ මුදල් ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට ඩොලර් වටිනාකම රුපියල් වටිනාකමට පරිවර්තනය කිරීමේ දී අතපසුවීමකින් විකුණුම් මිල භාවිතා කිරීමෙන්, මූල්‍ය ප්‍රකාශනවල අගය රු. 475,357 වැඩියෙන් දැක්වීම නිවැරදි කිරීමට වර්තමාන වර්ෂයේ කටයුතු යොදා ඇති අතර එම පරිවර්තන අගය ඉහල යෑම තුළින් පීඨ සංවර්ධන අරමුදලේ වර්ෂාවසාන ශේෂයන් ඉහළ යෑම හැර අන් කිසිදු බලපෑමක් සිදු නොවේ. | නිවැරදි වටිනාකම් නිවැරදි ගිණුම් වලට පිටපත් කල යුතුය. |
| ඌ) සමාලෝචිත වර්ෂයේ පැරණි තොග විකිණීමෙන් ලද ආදායම තුළ ස්ථාවර වත්කම් අබලි වත්කම් ලෙස අලෙවි කිරීමෙන් ලද රු.542,598 ක ආදායම් අඩංගු වී තිබුණු අතර එම අගයට අදාල පිරිවැය හා ඒවායේ සමුච්චිත ක්ෂය හඳුනාගෙන අදාල ගිණුම් වලින් ගැලපීම් කටයුතු කර නොතිබුණි. | විගණකගේ කරුණු දැක්වීම සමග එකඟවේ. අබලි ලෙස ඉවත් කරන ලද ස්ථාවර වත්කම් වල පිරිවැය හඳුනා ගැනීමේ අපහසුතාව හේතුවෙන් මෙසේ ඉවත් කරන ලද ස්ථාවර වත්කම් වල ක්ෂයවීම් හා පිරිවැය ගිණුම් වලින් ඉවත් කර නොමැත. දැනට සිදු කරමින් පවතින ස්ථාවර වත්කම් සත්‍යාපනය හා නැවත අගය කිරීමේ ක්‍රියාවලිය සහ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමෙන් පසුව නිසි පරිදි ගිණුම් තැබීමට කටයුතු කරමි. | ගිණුම් පිළියෙල කිරීම නිවැරදිව සිදුකල යුතුය |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| අ)ගබඩා 03ක තොග ඌනතා<br>ගබඩා 03ක තොග අතිරික්තය | 22,066,500<br>15,228,862 | 20,374,211<br>19,369,790 | 1,692,289<br>4,140,928 | මධ්‍යම ගබඩාවේ සත්‍යාපන අගය වන රු.11,056,214 තුළ ප්‍රාග්ධන වත්කම් රු. 2,193,326 ක් වේ. ඒ අනුව එහි වෙනස රු.470,906 කි. තොග සත්‍යාපන ශේෂය ලෙජර් ශේෂය සමග සසදා වෙනස්වීම සඳහා හේතු පරික්ෂා කරමින් පවතියි. | තොග සත්‍යාපන අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| ආ) දේපල පිරියත හා උපකරණ | 6,098,003,433 | 6,097,755,804 | 247,629 | විගණකගේ කරුණු දැක්වීම සමගඑකඟ වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.6,098,003,433 ලෙසින් සඳහන්වන මුදල නිවැරදිවන අතර ලේඛනයේ ගොඩනැගිලි යටතේ 2018 එකතුකල අගයට ලේජර් අංක 210188 සඳහා රු.249,709ක මුදලක් එකතුවිය යුතුය. | ගිණුම් ශේෂ අතර වෙනස්වීමට හේතු හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කළයුතුය |
| ඇ) උපචිත වියදම් | 69,531,077 | 66,192,277 | 3,338,800 | විගණකගේ කරුණු දැක්වීම සමග එකඟ වේ. නමුත්, මෙම සංඛ්‍යා දෙක අතර වෙනස වන්නේවිගණන ගාස්තු සඳහා වෙන් කල රු.3,338,800 වේ. උපලේඛනයේ එය සඳහන් කර නොමැත. | ගිණුම් ශේෂ අතර වෙනස්වීමට හේතු හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කළයුතුය |
| ඇ) විවිධතැන්පතු | 2,992,784 | 2,673,814 | 318,970 | විගණකගේ කරුණු දැක්වීම සමග එකඟ වේ. මෙම රු. 318,970ක මුදල රු.367,210ක වටිනාකම නිරවුල් කිරීමේ දී නිවැරදි වි ඇත | ගිණුම් ශේෂ අතර වෙනස්වීමට හේතු හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කළයුතුය |

| | | | | | |
|---|---|---|---|---|---|
| **ඉ) සැපයුම් හා පරිභෝජක ද්‍රව්‍ය** | | | | | |
| නිල ඇඳුම් සහ කුලී | 1,631,029 | 1,398,529 | 232,500 | විගනකගේ කරුණු දැක්වීම සමග එකඟ වෙමි.මෙම වියදම් වල එකතුවේ වෙනසක් නොවන අතර වැඩසටහන් වියදම් ප්‍රකාශනයේ වියදම් වල සිදු වී ඇති දෝෂයක් වන අතර වැඩසටහන් 28 ට අනුව වැඩසටහන් වියදම් ප්‍රකාශනය නිවැරදි විය යුතුය. | නිවැරදිව ගිණුම් ගත කළයුතුය |
| වෙනත් - 607 | 4,413,585 | 4,416,561 | 2,976 | | |
| **වෙනත් පුනරාවර්තන වියදම්** | | | | | |
| පශ්චාත් උපාධි පර්යේෂණ | 270,476 | 500,000 | 229,524 | | |
| ඊ)ශිෂ්‍ය නේවාසික ගාස්තු | 2,372,509 | 2,375,659 | 3,150 | විගණකගේ කරුණු දැක්වීම සමග එකඟ වේ. මෙම අදායම් ගිණුම් වල මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගය සහ ලෙජර් ගිණුම් වල දැක්වෙන අගයන් අතර වෙනස රු.367,210ක වටිනාකම නිරවුල් කිරීමේදී නිවැරදි වි ඇත | නිවැරදිව ගිණුම් ගත කළයුතුය |
| ලියාපදිංචි ගාස්තු (උපාධි අපේක්ෂක) | 640,775 | 682,325 | 41,550 | | |
| සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීමේ ගාස්තු | 1,152,550 | 1,059,800 | 92,750 | | |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අ) සැපයුම්කරුවන්ගේ රැඳවුම් මුදල් තැන්පතු | 14,480,878 | උප ලේඛන | විගණකගේ කරුණු දැක්වීම සමග එකඟ වේ.මෙම ශේෂයන් සඳහා උපලේඛන සකස් කරමින් පවති. | ඉදිරිපත් කර ඇති ගිණුම්වලට අදාලව දිනට ශේෂ තහවුරු කිරීමට උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය |
| ආ) කුලී නිවාස රැඳවුම් මුදල් තැන්පතු | 832,936 | උප ලේඛන | විගණකගේ කරුණු දැක්වීම සමගඑකඟ වේ.මෙමශේෂයන්සඳ හා උපලේඛන සකස් කරමින් පවති. | ඉදිරිපත් කර ඇති ගිණුම්වලට අදාලව දිනට ශේෂ තහවුරු කිරීමට උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) 2010 වර්ෂයේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ නිලධාරියෙකු විසින් ලබාගත් රු.310,000 අත්තිකාරම් මුදල පියවීමට මෙතෙක් කටයුතුකර නොතිබුණි. | මෙම අත්තිකාරම් මුදල පියවා ඇතත්, 2012 වර්ෂයේ සිට 2018 දක්වා අවසන් ගිණුම් වාර්තාවන් තුළ පියවිය යුතු මුදලක් ලෙස වෙනම පෙන්වා ඇත. මේ පිළිබඳ විගණන හා කළමනාකරණ කමිටුව විසින් පරීක්ෂා කර ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුකර ගිණුම් නිවැරදි කරගත යුතුය. |
| ආ) වසර ගණනාවක සිට පැවත එන රු.250,138 ක්වූ විවිධ කාර්යයන් වෙනුවෙන් ලබාදුන් අත්තිකාරම් සහ රු.38,970ක ණය ශේෂ 05ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණකගේ කරුණු දැක්වීම සමගඑකඟ වේ.මෙම විවිධ කාර්යන් වෙනුවෙන් ලබා දී තිබෙන අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී | අත්තිකාරම් ලබාදී කලක් ගතවී ඇති බැවින් කඩිනමින් අයකර ගැනීමට කටයුතුකළ යුතුය |

## 1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨයට ගොඩනැගිල්ලක් කුලියට ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී උපකුලපති ලෙස සේවය කළ මහාචාර්යවරයකුගේ කලත්‍රයා සහ ලේඛකාධිකාරී අතර ගිවිසුම්ගත වූ රු. 660,000 ක ගනුදෙනුව සම්බන්ධයෙන් ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. | පිළිගනිමි. මෙවැනි වැරදි ඉදිරියේදී හෙළිදරව් කිරීමට කටයුතු කරමි | ජාතික විගණන පනතේ අවශ්‍යතාවය අනුව ගිණුම්වල හෙළිදරව් කළයුතුය |

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ කථිකාචාර්යවරුන් වෙත ගෙවන ලද සංග්‍රහ දීමනා සහ අධ්‍යයන කමිටු රැස්වීම් වලට සහභාගී වීම වෙනුවෙන් 2018 අප්‍රේල් සිට 2018 දෙසැම්බර් දක්වා ගෙවන ලද රු.126,000ක දීමනා සඳහා රඳවාගැනීමේ බදුද අඩුකර නොතිබුණි. | අදාල බදු අඩුකිරීම්, 2019 වර්ෂයේ එකී පුද්ගල බදු අඩුකිරීම් සඳහා අදාල කරගැනීමට කටයුතු කරනු ලැබේ. | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අවශ්‍යතා අනුව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** අංක 571 | 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පැවති ටෙන්ඩර් තැන්පතු රු.1,656,710ක්ද 2015 සිට පවතින විවිධ තැන්පත් රු.1,134,161 ක්ද සහ වර්ෂ 2 සිට වර්ෂ 12 දක්වා කාලයක් ගිණුම්වල රඳවා තිබෙන රු.49,043,540 කොන්ත්‍රාත් රැඳවුම් මුදල් ආදායකයා විමසා ප්‍රතිචාර නොමැති නම් ආදායමට ගැනීමට කටයුතුකර නොතිබුණි. | විගණකගේ කරුණු දැක්වීම සමගඑකඟ වේ. මේ පිලිබඳව අපගේ අවධානය යොමුවූ අතර මෙම කොන්ත්‍රාත් වල රදවාගත් මුදල් මෙම කොන්ත්‍රාත් වල පවතින ගැටලු හේතුවෙන් ගිණුම්වල දිගුකාලයක් පවතින අතර ඒවා නිරවුල් කිරිමට මුලධන අංශය සහ නඩත්තු අංශය මගින් සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය |
| ඇ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය xx පරිච්ඡේදයේ 3.1 ඡේදය | සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුතු සෑම තැනැත්තෙක්ම පැමිණීමේ හා පිටවීමේ වේලාව සටහන් කළ යුතු වුවද අධ්‍යයන කාර්ය මණ්ඩලය අනුව කටයුතු කර නොතිබුණි. | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීමට පීඨාධිපතිවරුන් දැනුවත් කිරීම සිදු කරනු ලැබේ. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| ඇ) චක්‍රලේඛ<br>---------- | | | |
| i) 2015 ජූලි මස 14 දිනැති අංක 03/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රු. 25,000කට වැඩි අත්තිකාරම් මාණ්ඩලික නොවන නිලධාරින් 07 දෙනෙකු වෙත ලබාදීම, අදාළ කාර්යය නිමකර දින 10ක් ඇතුළත පියවිය යුතු වුවද එම කලය ඉක්මවා දින 05 - 199 අතර කාල පරාසයක ප්‍රමාද වී පියවා තිබීම, යම් විශේෂිත කාර්යයක් සඳහා නිලධාරින් 04 දෙනෙකු විසින් කලින් අත්තිකාරම් ලබාගැනීම සහ රු.9,600 සිට රු.56,094 දක්වා අත්තිකාරම් මුදලක් ප්‍රමාද වී පියවා තිබීම, නිලධාරින් දෙදෙනෙකු විසින් ලබාගත් එකතුව රු.15,000ක අත්තිකාරම් වියදම් නොකර ආපසු තැන්පත් කිරීමට දින 29 - 109 ක කාලයක් ගත වී තිබීම, විශේෂ කාර්යයක් සඳහා එක්වරකදී ලබාදිය හැකි උපරිම සීමාව වූ රු.100,000 ඉක්මවා විධිමත් අනුමැතියකින් තොරව නිලධාරීන් 11 දෙනෙකු විසින් අත්තිකාරම් ලබාගැනීම යන කරුණු චක්‍රලේඛයේ ප්‍රතිපාදන ඉක්මවා සිදුවී තිබුණි. | මාණ්ඩලික තත්ත්වයේ නිළධාරීන්ට පමණක් අත්තිකාරම් ලබාදීම වර්තමානයේදී සිදුකරන අතර අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයන් පිළිබඳව ගැඹුරින් සලකා බලා ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදු නොවීමට සහ අත්තිකාරම් මුදල් නිදහස් කිරීමේ දී චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| **ii)** මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ මු.අ.01/2015 /01 හා 2015 මැයි 15 දිනැති චක්‍රලේඛය | විදේශ ගමන්වලදී සංයුක්ත දීමනා ගෙවිය හැක්කේ අදාල සංචාරය හෝ වැඩසටහන සංවිධානය කරන ආයතනය විසින් ආහාරපාන හා නවාතැන් පහසුකම් නොසපයන අවස්ථාවලදී පමණක් වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 03කදී රු. 1,499,486ක සංයුක්ත දීමනා ගෙවා තිබුණේ අදාල වැඩසටහන් වලදී ආහාර හා නවාතැන් පහසුකම් නොසපයන බව තහවුරුකර නොගෙන වූ අතර මුදල් රෙගුලාසි 237 (ඇ) ප්‍රකාරව ගෙවීම් වවුචර් සමඟ ගෙවීම සනාථ කිරීම සඳහා විධිමත්ව ලබාගත් අරාධනා පත්‍ර නොමැතිව ගෙවීම් කර තිබුණි. | ඉදිරියේ දී මෙවැනි විදේශ ගමන් සඳහා මුදල් ගෙවීමේ දී මුදල් රෙගුලාසි 237(ඇ) ප්‍රකාරව සිදු කරනු ඇත. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි වලට අනුකූලව ගෙවීම් කළ යුතුය |
| ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ<br>-------------------- | | | |
| **i)** 2012 අප්‍රේල් 23 දිනැති අංක 981 | වාචික පරීක්ෂණ විභාග සඳහා එක් අපේක්ෂකයෙකු වෙනුවෙන් පරීක්ෂණ මණ්ඩලයක් සඳහා රු.100 බැගින් ගෙවිය හැකි වුවද පීඨ දෙකක පරීක්ෂණ මණ්ඩල 30ක් සඳහා පරීක්ෂණ මණ්ඩලයට අයත් සියළු සමාජිකයන් වෙනුවෙන් අනුමත මුදලට අමතරව රු.334,600 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | පිළිගනු ලැබේ. ඉදිරියේ දී අදාළ චක්‍රලේඛයට අනුව කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතුය |
| **ii)** 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 | විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛය අනුව පරීක්ෂණ පවත්වා මාස 03ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කිරීමට යටත්ව පිළිතුරු ඇගයීම් වෙනුවෙන් ගෙවීම් කළ හැකි වුවද සමාජවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 03 – 09 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණු අතර ඒ වෙනුවෙන් රු.7,945,442 ක් ගෙවීම් සිදුකර තිබුණි. | සීමිත අධ්‍යයන කාර්යය මණ්ඩලයක් ඇති බැවින් වැඩි කාලයක් ඉගැන්වීම් කටයුතු සඳහා යොදවන බැවින් පිළිතුරු පරීක්ෂාව සඳහා වැඩි කාලයක් ගත වේ. | චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතුය |
| **iii)** 2016 ජනවාරි 01 දිනැති අංක01/2016 | | | |
| | පශ්වාත්උපාධි ඩිප්ලෝමා පැවරුමක් පරික්ෂාව සඳහා රු.30 බැගින් ගෙවියයුතු වුවද රු.50 බැගින් ගෙවීම හේතුවෙන් 27,860 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වි.වි.ප්‍ර.කො.ස. 01/2016 චක්‍රලේඛය මගින් විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා සම්බන්ධිත ක්‍රියාකාරකම් | අංක 977 දරන චක්‍රලේඛය අභ්‍යන්තර විභාග සඳහා පමණක් අදාළවේ. චක්‍රලේඛයකින් |

| | | |
|---|---|---|
| | වෙනුවෙන් පරීක්ෂණ පැවැත්වීම හා ඊට අදාළ ගෙවීම් සම්බන්ධයෙන් දක්වා ඇත. මේ සඳහා අදාල වනුයේ වි.වි.ප්‍ර.කො.ස. චක්‍රලේඛ 977 වේ. එම චක්‍ර ලේඛ ප්‍රතිපාදන මත හා මුදල් කමිටුවේ පූරව අනුමැතිය මත පශ්චාත්උපාධි ඩිප්ලෝමා පැවරුමක් පරික්ෂාව සඳහා එක පැවරුමකට රු.50 බැගින් අදාළ ගෙවීම් නියමිත පරිදි සිදු කර ඇත. | ආවරණය නොවන ගෙවීම් සඳහා විධිමත් අනුමැතියක් ලබාගත යුතුය |
| අධ්‍යයන මණ්ඩල රැස්වීමකට එක් සාමාජිකයෙකුට රු.1,500 බැගින් ගෙවියයුතු වුවද රු.2,000 බැගින් ගෙවීම හේතුවෙන් රු.52,500ක් වැඩිපුර ගෙවා තිබුණි. | 01/2016 දරණ විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛයේ අධ්‍යයන මණ්ඩල රැස්වීම් සඳහා එක් සාමාජිකයෙකුට රු.1,500 ක් ගෙවා ඇත්තේ උපාධි පාඨමාලාවන් සඳහාය. පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා රේටයන් දක්වා නොමැත. අදාළ පාඨමාලාවේ අධ්‍යයන මණ්ඩල රැස්වීම් සඳහා එක් සාමාජිකයෙකුට රු. 2,000 ක් ගෙවීම් සිදු කර ඇත්තේ විශ්වවිද්‍යාලයීය අනෙකුත් පශ්චාත් උපාධි පාඨමාලාවන් හි ගෙවීම් සහ මුදල් කමිටුවේ අනුමත අයවැය ලේඛනයට අනුවය. | ගෙවීම් රේටයන් දක්වා නොමැති නම් විධිමත් අනුමැතියක් ලබාගත යුතුය. නො එසේ නම් අනුමත වී ඇති රේටයන් භාවිත කළ යුතුය. |
| බාහිර පාඨමාලා කාර්ය මණ්ඩල පරිපාලන තනතුරු දැරීම වෙනුවෙන් චක්‍රලේඛයේ අනුමත සීමාව ඉක්මවා මුදල් කමිටුවේ තීරණය මත රු.63,802ක් වැඩිපුර ගෙවා තිබුණි. | 01/2016 දරණ විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛයේ බාහිර උපාධි පාඨමාලාවන් සඳහා කාර්ය මණ්ඩල පරිපාලන තනතුරු | ගෙවීම් සඳහා චක්‍රලේඛයේ ප්‍රතිපාදන නොමැතිනම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් |

| | | |
|---|---|---|
| | වෙනුවෙන් නිර්දේශිත ගෙවීම් ප්‍රමාණයක් දක්වා තිබුණද පශ්චාත් උපාධි සඳහා ගෙවීම් නිර්දේශ කර නොමැත. අප පාඨමාලාවේ පාඨමාලා සමායෝජක හා පාඨමාලා අධ්‍යක්ෂක සති අන්ත දෙදින ද විශ්වවිද්‍යාලයේ රැඳී සිටිමින් තම සේවය සපයන බැවින් පිළිවෙලින් රු.18000/- හා රු.15000/- ක් බැගින් ගෙවීම් සිදු කරයි. එම ගෙවීම් ප්‍රමාණය විශ්වවිද්‍යාලයීය අනෙකුත් පශ්චාත් උපාධි පාඨමාලාවන්හී ගෙවීම් හා මූල්‍ය කමිටුවේදී අනුමත අයවැය ලේඛණයට අනුවය. | සභාවෙන් විධිමත් අනුමැතියක් ලබා ගතයුතුය |
| ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීම සහ ලකුණු ලබාදීම සඳහා පරීක්ෂකයෙකුට දෙනු ලබන සංයුක්ත දීමනාව පැය 03කට රු.2,000 ක්වුවද විනාඩි 40ක පරීක්ෂණයක් සඳහා රු.1,000 බැගින් රු.770,000 ක් ගෙවා තිබුණි. | පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රායෝගික ඉගැන්වීම් පරීක්ෂාව එක් පාඩමක් ඇගයීම පමණක් නොව එය ක්‍රියාවලීන් ගණනාවක් හා බැඳුණකි. අනිවාර්යෙන්ම සම්පූර්ණ කළ යුතු පාඩම් සටහන් සියල්ල අදාල පරීක්ෂකවරයාගේ පරීක්ෂාවට ලක්කිරීම,විනාඩි 40 බැගින් පාඩම් 05 ක් අධීක්ෂණය කොට ලකුණු ලබාදීම,ප්‍රදර්ශක පාඩම් මාලාවන් තුලින් සිසුන්ගේ පූර්ව සූදානම් සකස් කිරීම, සති 10 ක් පුරා ප්‍රයෝගික ඉගැන්වීම් අධීක්ෂණය පාසල් පද්ධතිය සමඟ සම්බන්ධව සිදුකිරීම, | ගෙවීම් සඳහා චක්‍රලේඛයේ ප්‍රතිපාදන නොමැතිනම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විධිමත් අනුමැතියක් ලබා ගතයුතුය |

| | | | |
|---|---|---|---|
| | | අධීක්ෂකවරුන් ඉතා දුර ප්‍රදේශවල සිට පැමිණීම යන සියළු කරුණු සලකා බලා එක් පාඩමක් සඳහා රු.1000/- ක මුදලක් ගෙවීම් සිදු කරයි. එයද මූල්‍ය කමිටුවේදී අනුමත අයවැය ලේඛනයට අනුව ගෙවා ඇත | |
| | වාචික සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටින එක් ශිෂ්‍යයෙකු සඳහා සමීක්ෂණ මණ්ඩල සාමාජිකයකුට රු.50 බැගින් ගෙවිය යුතු වුවද, රු.150 බැගින් රු.44,100ක් ගෙවා තිබුණි. | 01/2016 දරණ විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛයේ සම්මුඛ පරීක්ෂණය සඳහා එක් ශිෂ්‍යයකුට රු.50/- ක රේටයක් දක්වා ඇත්තෙ උපාධි පාඨමාලාවන් සඳහාය. පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා රේටයක් දක්වා නොමැත. අප පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණ සඳහා එක් ශිෂ්‍යයකුට රු.150/- ක් ගෙවීම් සිදුකර ඇත්තේ විශ්වවිද්‍යායීය අනෙකුත් ප්‍රශ්චාත් උපාධි පාඨමාලාවන්හි ගෙවීම් සහ මූල්‍ය කමිටුවේ අනුමත අයවැය ලේඛනයට අනුවය. | ගෙවීම් සඳහා චක්‍රලේඛයේ ප්‍රතිපාදන නොමැතිනම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විධිමත් අනුමැතියක් ලබා ගතයුතුය |
| **iv)** 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 චක්‍රලේඛයේ 5.5 ඡේදය | ස්වයං උත්පාදිත එක් එක් පාඨමාලාවට අදාලව වෙන වෙනම ගිණුම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් ලෙස හෙළිදරව් කලයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ එවැනි ගිණුම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | විගණකගේ කරුණු දැක්වීම සමගඑකඟවේ.මෙම පාඨමාලා වලට අදාල ගිණුම් මූල්‍ය ප්‍රකාශන වල සටහන් ලෙස හෙළිදරව් කර නොමැත. නමුත් වෙන වෙනම ගිණුම් සකස් කර ඇත. ඉදිරි වර්ෂයේ සිට එක් සටහනක් ලෙස හෙළිදරව් කිරීමට සටහන් කර ගන්නා ලදී. | චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 57,401,588ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 82,650,093 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.25,248,505ක වර්ධනයක් නිරීක්ෂණය විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ප්‍රභවය | 2017 | 2018 | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | සියයට |
| **ප්‍රධාන ආදායම් ප්‍රභවය** | | | | |
| රජයේ ප්‍රදාන | 1,200,175,000 | 1,435,668,000 | 235,493,000 | 16 |
| ආයෝජන පොළී | 26,764,943 | 18,960,132 | (7,804,811) | (41) |
| දේපළ කුලී | 2,625,069 | 1,821,730 | (803,339) | (44) |
| **ප්‍රධාන වියදම් ප්‍රභවය** | | | | |
| පුද්ගල පඩිනඩි | 950,263,040 | 1,175,963,503 | 225,700,463 | 19 |
| ගමන් වියදම් | 9,087,807 | 5,537,507 | (3,550,300) | (64) |
| ක්ෂය වීම් | 393,915,972 | 453,210,941 | 59,249,969 | 13 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය1:0.60 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය 1:0.80ක් ලෙස වර්ධනය වී තිබුණි. එමෙන්ම ක්ෂණික වත්කම් අනුපාතය ද පෙර වර්ෂය හා සසඳන කළ 1: 0.58 සිට1: 0.65 දක්වා වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) විවිධ ව්‍යාපෘති වෙනුවෙන් ලැබුණු, එම කාර්යය අවසන්වී වසර ගණනාවක් ගතවී ඇතත් එකතුව රු. 5,743,734 ක්වූ ගිණුම් ශේෂ 03ක් පියවා දැමීමට අවශ්‍ය කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවල වෙනත් අරමුදල් යටතේ දක්වා තිබුණි. | කාර්ය මණ්ඩල සංවර්ධන ආයතනයේ රු. 6,295,985 ක් මුදල ආයතනයේ කටයුතු සඳහා භාවිතා කෙරෙ. අනිකුත් අරමුදල් , මුදල් කමිටු අනුමැතිය මත වෙනත් කාර්යයන් සඳහා යොදාගැනීමට කටයුතු කෙරෙමින් පවතී. | රු.5,743,734ක්වූ ශේෂ 03 ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය |

| | | |
|---|---|---|
| ආ) අධ්‍යයන නිවාඩු ලබාගෙන පශ්චාත් උපාධි සම්පූර්ණ නොකර අවුරුදු 02 සිට 07 දක්වා කාල පරාසයක් තුළ බැඳුම්කර ගිවිසුම් කඩකරන ලද කතිකාචාර්යවරුන් සහ මහාචාර්යවරුන් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබූ අතර එකතුව රු.48,857,874 ක් වූ බැඳුම්කර 10ක වටිනාකම අයකර ගැනීමටද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, 2016 වර්ෂයේ සිට අයවිය යුතු රු.411,844 ක මුදල අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. | නිලධාරීන් 08 දෙනෙකුගේ කටයුතු මෙතෙක් අවසන් කර නොමැති බවත්, එක් නිලධාරියෙකුගෙන් විශ්වවිද්‍යාලයට අයවිය යුතු මුදල ඔහු විසින් පියවීමට කටයුතු කරන බවත්, රු.411,844 ක් වූ බැඳුම්කර අගය තම අර්ථසාධක මුදලින් අඩුකර ගැනීමට එකග වී ඇති අතර ඒ පිළිබද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීමට සූදානමින් සිටින බවත් දන්වා සිටිමි. | බැඳුම්කර ගිවිසුම් කඩකරන ලද කතිකාචාර්යවරුන්ගෙන් සහ මහාචාර්යවරුන්ගෙන් බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට සහ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය |
| ඇ) සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ ජනසන්නිවේදන විද්‍යාගාරය සඳහා 2014 වර්ෂය තුළ අවස්ථා කිහිපයකදී HETC නැමැති ව්‍යාපෘතිය යටතේ ලැබී ඇති රු.1,620,175 ක් වටිනා ජන සන්නිවේදන උපකරණ 29 ක් සහිත ජනසන්නිවේදන විද්‍යාගාරය ස්ථාපිතකර තිබුණද විද්‍යාගාරයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා දැනුමැති තාක්ෂණ නිලධාරියෙකු බඳවා ගෙන නොතිබුණු අතර එම උපකරණ, තාක්ෂණික දැනුමක් නොමැති නිළධාරීන් විසින් භාවිතා කර තිබුණි. | දැනුම ඇති නිලධාරියෙකු බඳවාගැනීමට මෙතෙක් නොහැකි විය. පීඨයට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ඉදිරියේ දී හැකි පරිදි ලබා දීමෙන් මෙම ගැටළු නිරාකරණය වනු ඇත | පුරප්පාඩු පවතින අංශ පරීක්ෂා කර බලාඅවශ්‍යතාව අනුව ඒවා පිරවීමට කටයුතු කළ යුතුය |
| ඈ)විශ්වවිද්‍යාල කථිකාචාර්ය වරයෙකුට 2018 ජුනි 24,25 දිනවල සම්මන්ත්‍රණයකට හා 2018 ජුනි 28 දින බ්‍රසීලයේ Sao polo විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුම් අත්සන් කිරීම් යන කාර්යයන් දෙකක් සඳහා සහභාගී වීමට දින 09ක් වෙනුවෙන් සංයුක්ත දීමනා හා අනියම් දීමනා රු.1,075,250ක් ගෙවා තිබූ අතර මොහු 2018 ජුනි 24,25 දිනවල පැවති සම්මන්ත්‍රණයට පමණක් සහභාගී වූ බවට සාක්ෂි ඉදිරිපත් කර ඇතත් 2018 ජුනි 28 දින Sao polo විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුම් අත්සන් කිරීම් කාර්යයට සහභාගී වූ බවට හා සහභාගි වීමේ අවශ්‍යතාවයක් තිබූ බවට සාක්ෂි නොමැතිව දින 05ක් සඳහා අ.එ.ජ.ඩොලර් 2,300ක් හෙවත් රු.374,600ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | මෙහි දක්වා ඇති වැඩිපුර ගෙවා ඇති මුදල රු. 405,000 ක් ලෙස දැක්වුවත් අපගේ තොරතුරු අනුව එය රු. 374,600 ක් ලෙස පහත පරිදි නිවැරදි විය යුතුය. ඒ අනුව මෙම මුදල බී.එම්.එස් බණ්ඩාර මහතාගෙන් අයකර ගැනීම සඳහා 2019.06.26 වන දින උපකුලපති තුමා මගින් ලිපියක් සහකාර අභ්‍යන්තර විගණක විසින් යොමු කර ඇත. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි වලට අනුකූලව ගෙවීම් කළ යුතුඅතර වැඩිපුර ගෙවාඇති ඩොලර් 2,300 වටිනාකම අදාළ නිලධාරියාගෙන් හෝ ඊට වගකිවයුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | |
|---|---|---|
| ඉ)විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකු 2018 ජුනි 24 සහ 25 දිනවල බ්‍රසීලයේ පැවති ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහභාගී වීමට හා 2018 ජුනි 28 දින බ්‍රසීලයේ Sao polo විශ්වවිද්‍යාල සමඟ ගිවිසුමකට අත්සන් කිරීමට යාම වෙනුවෙන් දින 09ක් සඳහා දිනකට ඩොලර් 75 බැගින් අනියම් දීමනා ලබාගෙන තිබූ අතර රජයේ නියෝජනයකරන නිල දූත කාර්යයක් ලෙස සැලකිය හැක්කේ 2018 ජුනි 28 දින Sao polo විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුම් අත්සන් කිරීමේ කාර්යය පමණක් බැවින් ඉතිරි කාලය සඳහා අනියම් දීමනා ලෙස දිනකට ඩොලර් 40ක් පමණක් හිමි බැවින් දින 07ක් සඳහා දිනකට ඩොලර් 35 බැගින් ඩොලර් 245ක් හෙවත් රු.39,690ක් වැඩිපුර ගෙවා තිබුණි. | විගණන විමසුමට අනුව මහාචාරය රංජිත් විජේවරධන මහතා වෙත අදාළ මුදල අයකර ගැනීම සඳහා ලිපියක් 2019.05.23 වන දින යොමු කර ඇත | චක්‍රලේඛ වලට අනුකූලව ගෙවීම් කළ යුතුය |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව දේශන පැවැත්වීම පිළිබඳ පරීක්ෂා කිරීමේදී ව්‍යාපාර කළමනාකරණ අංශයේ අභ්‍යන්තර කථිකාචාරවරුන් 08 දෙනෙකු ආවරණය කළයුතු පැය ප්‍රමාණයෙන් සියයට 20 සිට සියයට 60 දක්වා ද, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ කථිකාචාර්යවරු 14 දෙනෙකු විසින් පැය 89 සිට 257 දක්වාද කෘෂි පීඨයේ කථිකාචාර්යවරු 12 දෙනෙකු පැය 200 සිට 405 දක්වාද කාල පරාසයක දේශන පැය ආවරණය නොකළ අවස්ථා නිරීක්ෂණය විය. | සමාසිකය ආරම්භ වීමට පෙර පාඨමාලා සඳහා වන වෙන්කල පැය ගණන ඇතුලත්ව මුළු සමාසිකය සඳහා කාලසටහන් පිළියෙල කරනු ලැබේ. සති 15 අවසානයේ දී ආවරණය කල පැය ගණන සම්පූර්ණ කිරිමට නොහැකි වන අවස්ථා ඇති විය හැකි අතර එයට ප්‍රධාන වශයෙන් බලපානු ලබන්නේ කාලසටහනෙහි නිවාඩු දිනයන් සහ ශිෂ්‍යයන් විසින් දේශන වලට නොපැමිණෙන දින සඳහා අතිරේක දේශන නොපවත්වන අතර එම කොටස් ශිෂ්‍යයන් විසින් ස්වාධීනව ආවරණය කරගත යුතුව ඇති නිසාය. | අවශ්‍ය දේශන ප්‍රමාණය ආවරණය නොකිරීම පාඨමාලාවල ගුණාත්මක භාවයට බලපාන බැවින් දේශන ආවරණය සම්බන්ධව නිසි අවධානය යොමුකළ යුතුය |
| ආ)කළමනාකරණ විද්‍යා පීඨයේ බාහිර කතිකාචාර්යවරුන් 05 දෙනෙකු සියයට 27 සිට සියයට 58 දක්වා කාල පරාසයක දේශන ආවරණය නොකළ අවස්ථා පැවති බැවින් පැවැත්වූ පාඨමාලා වල ගුණාත්මක භාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය. | ශිෂ්‍යයන් සුළු ප්‍රමාණයක් නියමිත කාලයේදී උපාධිය සම්පූර්ණ නොකරයි. ශිෂ්‍යයන් දේශන වලට සහභාගිවීමේ ප්‍රතිශතය අඩුවීම, රැකියාවල නිරත සිසුන්ද මෙම පාඨමාලාවන්ට ඇතුලත් ව සිටීම, ව්‍යාපාර තොරතුරු තාක්ෂණය සහ සංචාරක සහ සත්කාර සේවා | උපාධිය සම්පූර්ණ නොකිරීමේ ප්‍රතිශතය වැඩි උපාධි පාඨමාලා පිළිබඳ වැඩි අවධානය යොමු කළ යුතුය |

| | |
|---|---|
| ඇතුළත්වීමේ සංඛ්‍යාව සමග සසදන කළ එක් එක් අධ්‍යයන අංශ වල උපාධිය සම්පූර්ණ නොකිරීමේ ප්‍රතිශතය සියයට 10ක් වූ අතර 2012/13 අධ්‍යයන වර්ෂයේ උපාධිය සම්පූර්ණ නොකිරීමේ සමස්ථ ප්‍රතිශතය 29% ක් හා දක්වා ඉහළ ගොස් තිබුණි. 2010/11 සිට 2012/13 දක්වා අධ්‍යයන වර්ෂ හිBIT සහ THM උපාධි පාඨමාලා වල උපාධිය සම්පූර්ණ නොකිරීමේ ප්‍රතිශතය පිළිවෙලින් 41% හා 23%ට වැඩි ඉහළ අගයක් ගෙන තිබුණි. | කළමනාකරණ උපාධි දෙකෙහි විෂය නිර්දේශයෙහි ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැඩි වශයෙන් තිබීම, ආදි කරුණු මේ සඳහා බලපා ඇත. ඉහත කරුණු පිළිබඳව ඉදිරි විෂය නිර්දේශ සංශෝධනයේදී සලකා බැලීමට කටයුතු කරනු ඇත. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍ර ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා පූර්ව සූදානමක් නොමැතිව ලංසුකරුවන් තෝරාගෙන 2017 අගෝස්තු 24 දින රු.143,000,000 කට ගිවිසුම්ගතව රු. 16,479,500ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබා දී තිබුණද මේ දක්වා ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය විසින් නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය නොමැති ගොඩනැගිලි වෙනුවෙන් මේ වන විට අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. එසේම අදාළ කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමෙන් පසු එම ඉදිකිරීම හරිත සංකල්පය මත සිදු කළ යුතු බව දන්වා ඇති හෙයින් ඊට අදාළ අනුමැතිය ලබා ගැනීම මේ වන විට අවසන් අදියරේ පවතී. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර සැලසුම් කිරීමේ අදියරට ප්‍රමුඛතාවය දිය යුතු අතරම වැඩ පූර්ව අත්තිකාරම් ගෙවීමට පෙර වැඩබිම සූදානම් බව තහවුරු කරගත යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (ආ) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන දැන්වීම් හැකි සෑම අවස්ථාවකදීම වැඩියෙන් අලෙවිවන ජාතික පුවත්පතක පළ කල යුතු වුවද, විගණනයට භාජනය වූ බොහෝ ප්‍රසම්පාදන එක් පුවත්පතක සඳහන් කිරීමෙන් ප්‍රමාණවත් තරඟකාරිත්වයක් ඇතිකර නොතිබුණි. | අදාළ ප්‍රසම්පාදන දැන්වීම අදාළ රෙගුලාසි අනුකූලව පළ කිරීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර ඇත. ඒ අනුව, මෙම ඉදිකිරීමට අදාළ ප්‍රසම්පාදන දැන්වීම, ලංකාවේ වැඩි අලෙවියක් සහිත ජාතික පුවත්පතක් වන "ඩේලි නිවුස්" පුවත්පත මඟින් පළකර ඇත. එනමුත් ඉදිරියේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව වැඩි අලෙවියක් සහිත සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදුකිරීමට කටයුතු කරමි. | කොන්ත්‍රාත් කටයුතු වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයට අනුකූලව සහ වැඩි තරඟකාරිත්වයක් ඇතිවන පරිදි කටයුතු කළයුතුය |

| | | |
|---|---|---|
| ආ) 2018/2019 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයට මසකට රු.5,257,662 ක ආරක්ෂක සේවාව සැපයීම සඳහා සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තරඟකාරිත්වය සීමාකරන ලද කොන්දේසි ටෙන්ඩර් ලියකියවිලිවලට ඇතුළත් කිරීම නිසා ප්‍රසම්පාදනයේ තරඟකාරිත්වයේ සීමාවීම් ඇතිවිය. | විශ්වවිද්‍යාලය මගින් පළ කරන ලද පුවත්පත් දැන්වීමෙහි සඳහන් පරිදි අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන දෙකෙන් එක් ආයතනයක අදාළ වර්ෂ 03ක සේවා පළපුරුද්ද නොතිබුණු අතර අනෙක් ආයතනයෙන් අදාල සේවා සහතිකයන් හෝ කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද ලිපියක් ටෙන්ඩර් පත්‍රිකා සමග අමුණා ඉදිරිපත් කර නොමැත. එසේ වුවද එම ආයතනයෙන් සේවා වාර්තා ලබාගැනීම සඳහා ලිපියක් යොමු කරන ලද අතර එයට ප්‍රතිචාර දක්වා නොමැත. ආරක්ෂක සේවා සැපයීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීමේදී අදාල පුවත්පත් දැන්වීමෙහි රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල මෙන්ම මහා පරිමාණයේ පෞද්ගලික ආයතනවල පළපුරුද්ද පිළිබඳව විමසන අතර විශ්වවිද්‍යාල පද්ධතිය තුල සේවා පළපුරුද්ද පිළිබඳව විශේෂයෙන් සඳහන් කිරීමට තාක්ෂණික ඇගයයීම් කමිටුව විසින් තීරණය කර ඇත. විශ්වවිද්‍යාලය සඳහා සේවා සැපයීමක් ලබාගැනීමේදී එය වඩාත් සතුටුදායක හා විශ්වවිද්‍යාලය බලාපොරොත්තු වන ආකාරයේ උපරිම සේවා ඵලදායිතාවයක් ලබාගැනීම සඳහා සුදුසු ආයතනයක් තෝරාගැනීම අරමුණු කරගෙන මෙම කොන්දේසිය ඇතුලත් කර ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තරඟකාරිත්වය සීමා කරන ලද කොන්දේසි ටෙන්ඩර් ලියකියවිලි වලට ඇතුළත් නොකිරීමට කටයුතු කළ යුතුය |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ)විශ්වවිද්‍යාලයේ පිවිසුම් මාර්ගයේ බහුකාර්යය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සකස්කර තිබුණු ඉංජිනේරු ඇස්තමේන්තුවට අනුව නියමිත පිරිවිතරයන්ට අනුව ටයිල් ඇතිරීම සිදුනොකිරීම හේතුවෙන්, අනුමත කළ ප්‍රමිතීන් ඇතුළත් තාක්ෂණික අවශ්‍යතාවය ඉටුවී නොතිබුණු අතර වෙළඳපොල මිලගණන් අනුව ඉංජිනේරු ඇස්තමේන්තුවේ යෙදිය යුතු ටයිල් වර්ග මීටරයක් හා යොදා | Type A බහුකාර්යය ගොඩනැගිල්ල සඳහා කොන්ත්‍රාත්කරු අනුමැතියට ඉදිරිපත් කර තිබුණු ටයිල් සාම්පල වල Code අංක ටයිල්වල පසුපස සඳහන් වූ අතර අනුමත කරන ලද ටයිල් සාම්පල් හඳුන්වා දෙන ලද්දේ එම ටයිල් පිටුපස සඳහන් Code අංකයෙනි. ඒ අනුව රොසෙල් ආයතනයේ නිෂ්පාදිත Code අංක RC 204 GG සඳහන් 400 X 400 ප්‍රමාණයේ ටයිල් වර්ගය ගොඩනැගිල්ල තුල හඳුන්වාදුන් ස්ථාන සඳහා භාවිතයට අනුමැතිය ලබා දී ඇත.<br>Type B ගොඩනැගිල්ලේ කොන්ත්‍රාත්කරුටද මෙම ටයිල් වර්ගයම භාවිතය සඳහා උපදෙස් දෙන ලදී. නමුත් මෙම ගොඩනැගිලි දෙකෙහිම අතුරා ඇත්තේ Code අංක 7GG ටයිල් වන අතර | වැඩිපුර ගෙවා ඇති මුදල අයකිරීමට කටයුතු කළයුතුයි. |

| | | |
|---|---|---|
| තිබුණු ටයිල් වර්ග මීටරයක් අතර රු.1,487ක මිල වෙනසක් පැවති බැවින් කොන්ත්‍රාත් කරුට රු.940,278ක අමතර මිල වාසියක් ලබාගැනීමට ඉඩකඩ සලසා තිබුණි. | අනුමත කළ ටයිල් සහ අතුරා ඇති ටයිල් සාම්පල සමාන බව රොසෙල් ආයතනයේ තාක්ෂණ නිලධාරි විසින් පවසන ලදී.මේ අනුව **Type A** සහ Type B ගොඩනැගිලිවල අනුමැතිය සඳහා ඉදිරිපත්නර ඇත්තේ Code අංක 7GG ටයිල් වේ. | |
| ආ)විශ්වවිද්‍යාල පිවිසුම් මාර්ගයේ බහුකාර්යය ගොඩනැගිලි සංකීර්ණයේ අදියර 11ට අයත් A හා B ගොඩනැගිලි 02ට අදාලව ලද ලංසුකරුගේ CIDA ලියාපදිංචිය ලංසු ඇගයීමට පසුදින කල්පිරීම නිසා අවලංගු වන බව දක්වා ප්‍රතික්ෂේප කර, ලැබී තිබුණු සියලු ලංසු අවලංගු කර, නැවත මිල ගණන් කැඳවා තිබුණි. A ගොඩනැගිල්ල සඳහා පෙර ලංසු ඉදිරිපත් කිරීමේ දී අවම ලංසුව ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුට සහ B ගොඩනැගිල්ල සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට පෙර අවම මිල ඉදිරිපත් කළ මිලට වඩා ඉහළ ලංසුවකට කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදලට රු.7,303,917 ක් අලාභයක් සිදුව තිබුණි. | අවම මිල ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුගේ ලංසු ලියවිලිවල සුදුසුකම් කොන්දේසි අංක 4.2 ඡේදයට අනුව වලංගු ලියාපදිංචි කාලය 2017 දෙසැම්බර් 07 දක්වා පැවතිය යුතු වුවද ඊට අනුකූල නොවීම හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය අනිවාර්ය අතර ලියාපදිංචිය අළුත් කරවාගැනීම සම්බන්ධව කොන්ත්‍රාත්කරු විමසුවද, 2017 ඔක්තෝබර් 02අදාළ ලියවිලි ඉදිරිපත් කර නොතිබුණි. දෙවන වර ලංසු කැඳවීමේ දී එම ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලංසුවේ මිල ගණන් පිළිබඳව සංසන්දනාත්මක ලෙස හෝ තවදුරටත් ඇගයීමක් සිදු නොකරනු ලැබේ. | කොන්ත්‍රාත් කටයුතු වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ න සංග්‍රහයට අනුකූලව සහ විශ්වවිද්‍යාල අරමුදලට පාඩු නොවන අන්දමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළයුතුය |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 118ක්ද, පුස්තකාල කාර්ය මණ්ඩල තනතුරු 4ක්ද, පරිපාලන කාර්ය මණ්ඩල තනතුරු 4ක්ද, වෛද්‍ය නිළධාරි තනතුරක්ද, අධ්‍යයන සහයක තනතුරු 17ක්ද, තාක්ෂණ අංශයේ තනතුරු 19ක්ද, ලිපිකරු හා ආශ්‍රිත කාර්ය මණ්ඩල තනතුරු 23ක් හා ප්‍රාථමික කාර්ය මණ්ඩල තනතුරු 50ක්ද ලෙස මුළු තනතුරු 236ක් පුරප්පාඩුව පවතින අතර වෙනත් විධායක නිළධාරි තනතුරක්,ලිපිකරු හා ආශ්‍රිත කාර්ය මණ්ඩල තනතුරු 14ක් හා ප්‍රාථමික කාර්ය මණ්ඩල තනතුරු 34ක් ඇතුළුව තනතුරු 49ක අතිරික්තයක් සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි | පවත්නා පුරප්පාඩු ඉක්මනින් පිරවීමට කටයුතු කළ යුතුය |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 ජනවාරි 27 දිනැති අංක PED/27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද්දේ 2019 අප්‍රේල් 09 දිනදීය | අදහස් දක්වා නොමැත | අංක PED/27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ප්‍රකාරව දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුය |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ 134 (3)ආයතනයේ අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි | මේ වන විට සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විශ්වවිද්‍යාලයේ රජයේ විගණන අධිකාරි වෙත යොමු කිරීම සිදු කෙරේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |

**4.3 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පැවතුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාළව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාල තම ක්‍රියාකාරී සැලැස්මෙහි ඊට අදාල ක්‍රියාකාරකම් ඇතුළත්කර තිබූ බවට හා වාර්ෂික අයවැය ලේඛනයෙහි ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසාගෙන තිබූ බවට හඳුනාගෙන නොහැකි විය. | මේ පිළිබඳ ව සියළුම පීඨාධිපති වරුන්ගෙන් අදාළ තොරතුරු විමසා ඇති අතර ඒ අනුව මෙම මෙහෙයුම් ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිවෙත් මාර්ගෝපදේශ මාලාව ක්‍රියාත්මක කිරීම විශ්වවිද්‍යාලය මඟින් ඉදිරියේ දී සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුය |